# ප්‍රාදේශීය ලේකම්තුමියගේ පණිවිඩය



ගාල්ල කඩවත්සතර, බහු වාර්ගික, බහු ආගමික ජන සමාජයක් වෙසෙන අතිශය නාගරික සංකීර්ණ පරිපාලන ව්‍යුහයකින් හෙබි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකි. එහිදී සාමාන්‍ය පරිපාලන කටයුතු සිදුකරන අතරතුර ජලගැලීම්, නාය අවධානම් ආදී හදිසි ආපදා අවස්ථාවන්ට මුහුණ දීමට සිදුවීම මෙම කොට්ඨාසයේ සුවිශේෂී ලක්ෂණයකි. නමුත් සමස්ථ ලෝකයම අර්බූදකාරී අවස්ථාවක් ඇතිකළ මෙම කොවිඩ් 19 වසංගත තත්වය අපහටද නවමු අත්දැකීමක් විය.හදිසි ආපදා තත්වයන්ට මුහුණ දී මා ලබා තිබූ පන්නරය මෙම අනපේක්ෂිත අර්බුදය හමුවේදී ක්‍රියාත්මක වීමට මා පොලඹවන ලදි. මෙම වසංගත තත්වය යටතේදී ලෝකයේ බොහෝ රටවල්, බොහෝ ආයතන, බොහෝ ජනසමාජ අසීරුතාවට පත්වන අන්දම වහාම අවබෝධකරගත් මා රජයේ හා සෞඛ්‍ය අංශයන්හි උපදෙස් පිළිපදිමින් කොට්ඨාශයේ ජනතාව වෙතගොස් සේවා සැපයිය හැකි නව සේවා සැපයුම් ජාලයක් නිර්මාණය කිරීම හා එය ක්‍රියාත්මක කිරීමට නව පද්ධතියක් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කලෙමි.

එහිදී රෝග ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා රජය සහ සෞඛ්‍ය අංශ ලබාදුන් උපදෙස් අනුගමනය කරන අතරතුර නිරෝධායන නීතීන් ක්‍රියාත්මක කිරීම හමුවේ අසීරුතාවට පත්ව ඇති ජනතාව වෙත ළඟා විය හැකි සෞඛ්‍යාරක්ෂත උපකරණ හා මෙවලම් වලින් මාගේ කාර්යමණ්ඩලය සන්නද්ධ කොට දෛනිකව අත්‍යාවශ්‍ය සේවාවන් ලබාදීමට මුල් අවස්ථාවේම පියවර ගනු ලැබීය.

එහිදී කාර්යාලයෙන් බැහැර කොට්ඨාසයේ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන, ව්‍යාපාරික ප්‍රජාව, පරිත්‍යාගශීලීන් දානපතියන් සම්බන්ධ කරගනිමින් මෙම පද්ධතිය නිර්මාණය කිරීමට අවශ්‍ය සියළු සහයෝගය ලබාගන්නා ලදි.

පැය අටේ සේවා වැඩ මුරයෙන් බැහැරව ජනතා අවශ්‍යතා අනුව ඔවුන්වෙත ගොස් සේවා සැපයීමේ ක්‍රමවේදය ජනතා සේවාවන්හි නවමු පැතිකඩක් නිර්මාණය වීමටද බලපෑ හැකිය. අප ක්‍රියාත්මක කළ මෙම වැඩසටහන පසුව පූර්වාදර්ශයක් ලෙස ගෙන ඇති ආකාරයද දක්නට ලැබිණ.

මෙහිදී කොට්ඨාසයේ පළමු පුරවැසියාගේ සිට දුගී මගී යාචකාදී සියළු ස්ථර නියෝජනය වන ලෙස මෙම සහන සේවා ක්‍රියාන්විතය දියත් කිරීම උදෙසා සකස් කළ සූක්ෂම ජාල පද්ධතිය ආපදා තත්වය බැහැර යනතෙක් අඛන්ඩව ක්‍රියාත්මක වීම තුළ අප වෙත නන් දෙසින් පැසසුම් ලැබිණ. එහිදී දිවා රෑ නොබලා මා ශක්තිමත් කළ මාගේ සහකාර ප්‍රාදේශීය ලේකම් තුමිය ප්‍රමුඛ ඒ වෙනුවෙන්ම කැපවූ කාර්ය මණ්ඩලය පළමුව සිහිපත් කළ යුතුය. එයට අමතරව මා සමග අත්වැල් බැඳගත් කොට්ඨාසයේ සෙසු ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල, ව්‍යාපාරික ප්‍රජාව, සිවිල් පුරවැසියන් ඇතුළු සියළු දෙනා මෙහිදී කෘතඥතා පූර්වකව සිහිපත් කරමි

අයි.හිමාලී රත්නවීර

ප්‍රාදේශීය ලේකම්

කඩවත්සතර - ගාල්ල

## සහකාර ප්‍රාදේශීය ලේකම්තුමියගේ පණිවිඩය



ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය තුළ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. පරිපාලනමය වශයෙන් වඩාත් සංකීර්ණ සමාජ උපලබ්ධියක් සහිත වටපිටාවකින් නිර්මිත මෙය ගාලු නගරය කේන්ද්‍ර කරගත් ද්විභාෂා කොට්ඨාසයකි. කොට්ඨාසයේ ජනතාව වෙනුවෙන් විශිෂ්ට හා කාර්යක්ෂම සේවාවක් සැපයීම වෙනුවෙන් වන දැක්මකින් යුතු අප මෙම Covid 19 වෛරසය පැතිරී යාමත් සමඟ ඇතිවූ ව්‍යසනකාරී අවස්ථාවේ ඔවුන් වෙනුවෙන්සමස්ත රාජ්‍ය සේවයේ ඉහළම ගෞරවණීය සත්කාරය පුද කරන්නට ලැබීම ගැන අතිශයින් සතුටට පත්වෙමු.

සියලුම සැපයුම් සේවා අඩපණව ක්‍රියා විරහිත මොහොතක ඔවුන්ගේ සුවහසක් අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය සියල්ලක් ම සම්පාදනය කරමින් ජන ජීවිතය සුමට ව පවත්වා ගෙන යාමට පහසුකම් සැපයීම පමණක් නොව මාරාන්තික වෛරසය අසාදනය නො වීමට තරම් සුක්ෂම ලෙස නිලධාරීන් සහ ඔවුන්ගේ සබැඳියන් ආරක්ෂා කිරීමට ගත් ක්‍රියාමාර්ග අතිශයින් සාර්ථක වීම සතුටට කරුණකි. තවද, ඒ පිටුපස සිටින අයෝමය හස්තය බඳු ප්‍රාදේශීය ලේකම්තුමියගේ දුරදර්ශී කලමණාකරිත්වය හා සහ සම්බන්ධ වීමට ලැබීමත් භාග්‍යයක් කොට සලකමි. මෙම අවස්ථාවේ මහජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් සද්භාවයෙන් කැප වූ අප කාර්යය මණ්ඩලයේ සියලුම නිලධාරීන් වෙත මාගේ ගෞරවණීය ආචාරය පුදකිරීමට අවස්ථාවක් කොට ගනිමි.

කොරෝනා මර්දන මානුෂීය වැඩසටහනේ කූටප්‍රාප්තියේ සිටින අප ඒ වෙනුවෙන් වන “රට වෙනුවෙන් කඩවත්සතර අපේ දිනපොතින් බිඳක්” හි මෙලෙස සටහනක් තබන්නට ලැබීම රාජකාරී දිවියේ තවත් හැරවුම් ලක්ෂක් බව අභිමානයෙන් යුතුව සඳහන් කරමි. එබැවින් මෙම බාධක සියල්ල ජයගෙන දැන් දැන් යළි සීඝ්‍ර ඇරඹුමක් අවශ්‍ය ව ඇත. අඩපණ වූ ආර්ථිකය යළි පණගැන්විය යුතු, අකර්මණ්‍ය වූ සියලු සම්පත් යළි භාවිතයට ගත යුතු, සීසීකඩ වූ වික්ෂිප්ත පවුල් ඒකක යළි ශක්තිමත් කළ යුතු වූ කාලය එළඹ ඇත. ජීවිත යළි ගොඩනැගිය යුතුව ඇත. මිලින වූ අරමුණු, සිතුවිළි ප්‍රබෝධමත් කල යුතුව ඇත. නැවතුම නැවැත්විය යුතුය. එසේ නම් සියල්ල යළි ආරම්භ කල යුතුය.

නිහාරා මෙලනි වෙත්තසිංහ
සහකාර ප්‍රාදේශීය ලේකම්
ගාල්ල කඩවත්සතර

## ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හැඳින්වීම

ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19 අතුරින් මුහුදු වෙරළට යාබදය පිහිටි ප්‍රමාණය අතින් කුඩාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි. මෙම කොට්ඨාසය වෙරළ කලාපයට යාබදව සැතපුම් 5 කට අඩු දුර ප්‍රමාණයක විහිදී ඇති අතර එය රට අභ්‍යන්තරයට වෙරළේ සිට සැතපුම් 4 කට වඩා අඩු දුර ප්‍රමාණයක විහිදේ.

කොට්ඨාසයේ පිහිටීම

මෙම කොට්ඨාසය නැගෙනහිර දේශාංශක 80 – 17 අතරද උතුරු අක්ෂාංශ 60 හා 6.05 අතරද පිහිටා ඇත.

උතුරින් හා නැගෙනහිරින් බෝපේ පෝද්දල  හා අක්මීමණ ප්‍රාදේශීය ලේකම් කොට්සශයද දකුණින් ඉන්දියන් සාගරයද ,වයඹින් හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයද, ගිණිකොනින් හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයද මායිම් වේ.

මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වර්ග කි.මී. 23.9 ක් නැතහොත් හෙක්ටයාර් 2390 ක් විශාලවේ.මෙම කොට්ඨාසයට ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු බිම් ප්‍රමාණයෙන් 1.5% ක් අයත් වේ.

1992 දෙසැම්බර් 01 අගහරුවාදා අංක 743/11 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 1 කොටස 1 වන ජේදය අනුව මෙම කොට්ඨාසයේ මායිම් මෙසේය.

උතුරට : උක්වත්තේ සිට කපා ඇති ඇල , උස් ඒදණ්ඩ , වටරුක පාර, ලන්දෑව හන්දිය , කලේගාන ගිංතොට පාර , කිතුලම්පිටිය පාර , බද්දේගම පාර , හිරිඹුර පාර, වදුරඹ පාරේ  සිට ලබුදුව හන්දිය දක්වා දකුණු පස කොටස.

දකුණ : මුහුදු තීරය

නැගෙනහිරට : මොරිස් පාර හේලි පාර , දික් ඇල දෙවට පාලම දක්වා

බස්නාහිරට : ගිංගග

කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨායේ පරිපාලන බෙදීම් අනුව කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 50 කට වෙන් කර ඇත. ඉන් 07 ක් බෝපේ පෝද්දල ප්‍රාදේශිය සභාවට අයත් වන අතර 43 ක් ගාල්ල මහ නගර සභා බල ප්‍රදේශයට අයත් වේ. මෙම බෙදිමට පෙර පැවතියේ ග්‍රාම නිලධාරී වසම් 21 කි. පරිපාලනයේ පහසුව සදහා එය 1990 ග්‍රාම නිලධාරී වසම් 50 කට වැඩි කරන ලදි.

**ග්‍රාම නිලධාරී වසම් හා එහි වර්ග ප්‍රමාණය**

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම් අංකය | ග්‍රාම නිලධාරී වසමේ නම | භූමි ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|---|
| 1 | 96 | කුඹල්වැල්ල  දකුණ | 64 |
| 2 | 96 ඒ | මහමෝදර | 61 |
| 3 | 96 බී | ගල්වඩුගොඩ | 59 |

| | | | |
|---|---|---|---|
| 4 | 96 සී | කළුවැල්ල | 44 |
| 5 | 96 ඩී | කොටුව | 48 |
| 6 | 96 ඊ | රිච්මන්ඩ්කන්ද | 48 |
| 7 | 96 එෆ් | කන්දෙවත්ත | 35 |
| 8 | 96 ජී | චිනකොරටුව | 33 |
| 9 | 96 එච් | මිනුවන්ගෙඩ | 17 |
| 10 | 96 අයි | ඔසනගොඩ | 13 |
| 11 | 99 ජේ | කුඹල්වැල්ල උතුර | 18 |
| 12 | 97 | කොන්ගහ | 21 |
| 13 | 97 ඒ | වැලිවත්ත | 27 |
| 14 | 97 බි | මඩපාතල | 23 |
| 15 | 97 සී | පොකුණවත්ත | 47 |
| 16 | 97 ඩි | දංගෙදර නැගෙනහිර | 49 |
| 17 | 98 | මඩවලමුල්ල දකුණ | 38 |
| 18 | 98 ඒ | මඩවලමුල්ල උතුර | 57 |
| 19 | 98 බී | බටගන්විල | 38 |
| 20 | 98 සී | සංඝමිත්තපුර | 23 |
| 21 | 98 ඩී | දංගෙදර බටහිර | 31 |
| 22 | 99 | මාගාල්ල | 75 |
| 23 | 99 ඒ | තලාපිටිය | 17 |
| 24 | 99 බී | පෙට්ටිගලවත්ත | 47 |
| 25 | 99 සී | මකුළුව | 53 |
| 26 | 99 ඩී | දේවාතුර | 28 |
| 27 | 100 | කටුගොඩ | 44 |
| 28 | 100 ඒ | දෙවට | 37 |
| 29 | 101 | මාඉටිපේ | 85 |
| 30 | 101 ඒ | දෙද්දුගොඩ දකුණ | 68 |
| 31 | 101 බී | මිලිද්දුව | 74 |

| | | | |
|---|---|---|---|
| 32 | 101 සී | දෙද්දුගොඩඋතුර | 52 |
| 33 | 101 ඩී | වැලිපත | 66 |
| 34 | 101 ඊ | මලිගස්පේ | 29 |
| 35 | 102 | දඩල්ල බටහිර | 41 |
| 36 | 102 ඒ | දඩල්ල නැගෙනහිර | 24 |
| 37 | 102 බී | වලව්වත්ත | 50 |
| 38 | 102 සී | සියඹලාගහවත්ත | 56 |
| 39 | 103 | ගිංතොට බටහිර | 56 |
| 40 | 103 ඒ | ගිංතොට නැගෙනහිර | 49 |
| 41 | 105 | වැලිපිටිමෝදර | 69 |
| 42 | 106 | කුරුදුවත්ත | 70 |
| 43 | 107 | පියදිගම | 91 |
| 44 | 107 ඒ | බෝපේ උතුර | 24 |
| 45 | 108 | උක්වත්ත නැගෙනහිර | 72 |
| 46 | 108 ඒ | මහහපුගල | 94 |
| 47 | 108 බී | උක්වත්ත බටහිර | 92 |
| 48 | 119 | බෝපේ බටහිර | 38 |
| 49 | 119 ඒ | බෝපේ නැගෙනහිර | 28 |
| 50 | 130 | ඇත්තිලිගොඩ දකුණ | 67 |
| **එකතුව** | | | 2390 |



ග්‍රාම නිලධාරි වසම් - ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
N
W
E
S
හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
ශ්‍රී ලංකාව
උක්වත්ත නැගෙනහිර
උක්වත්ත බටහිර
මහ හපුගල
කුරුඳුවත්ත
බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
වැලිපිටිමෝදර
ගිංතොට බටහිර
පියදිගම
ගිංතොට නැගෙනහිර
බෝපේ උතුර
කුඹල්වැල්ල උතුර
මඩවලමුල්ල දකුණ
මඩවලමුල්ල උතුර
දෙද්දුගොඩ උතුර
දෙද්දුගොඩ දකුණ
මාඉටිපේ
වැලිපත
රිච්මන්ඩ්කන්ද
බෝපේ නැගෙනහිර
දඩල්ල නැගෙනහිර
බොපේ බටහිර
දඩල්ල බටහිර
බටගන්විල
දංගෙදර බටහිර
මලිගස්පේ
දංගෙදර නැගෙනහිර
අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
මිලිද්දුව
ඇත්තිලිගොඩ දකුණ
ගල්වඩුගොඩ
පොකුණවත්ත
වලව්වත්ත
සියඹලාගහවත්ත
කුඹල්වැල්ල දකුණ
සංඝමිත්තපුර
මඩපාතල
කෝන්ගහ
මකුළුව
ඉන්දියන් සාගරය
ඔස්තගොඩ
කන්දෙවත්ත
තලාපිටිය
මහමෝදර
මිණුවන්ගොඩ
වැලිවත්ත
දේවාතුර
පෙට්ටිගලවත්ත
කළුවැල්ල
මාගාල්ල
කටුගොඩ
විතකොරටුව
දෙවට
කොටුව
හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
සැලසුම : දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - ගාල්ල
0.85 0.425 0 0.85 Kilometers

## කොට්ඨාසයේ ජනගහන ව්‍යාප්තිය

ගාල්ල දිස්ත්‍රික්කය ගැන සළකා බැලීමේදී අධිකම ජනඝනත්වයක් ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ලෙස කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හැඳින්විය හැකිය. අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලට සාපේක්ෂව බැලීමේ දී භූමි ප්‍රමාණයෙන් කුඩාම කොට්ඨාසයද මෙය වේ. මෙයට ප්‍රධානම හේතුව වන්නේ නාගරික ප්‍රදේශයක් විමයි. 2019.12.31 දිනට ජනගහනය 118283ක් වන අතර මුළු පවුල් සංඛ්‍යාව 28102ක් වේ.

- **ග්‍රාම නිලධාරී වසම අනුව පවුල් සංඛ්‍යාව බෙදීයාම**

| අනු අංකය | වසම් අංකය | ග්‍රාම නිලධාරී වසම | පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | 96 | කුඹල්වැල්ල දකුණ | 541 |
| 2 | 96 ඒ | මහමෝදර | 369 |
| 3 | 96 බී | ගල්වඩුගොඩ | 1040 |
| 4 | 96 සී | කළුවැල්ල | 380 |
| 5 | 96 ඩී | කොටුව | 274 |
| 6 | 96 ඊ | රිච්මන්ඩ්කන්ද | 500 |
| 7 | 96 එප් | කන්දෙවත්ත | 720 |
| 8 | 96 ජී | චිනකොරටුව | 307 |
| 9 | 96 එච් | මිනුවන්ගෙඩ | 107 |
| 10 | 96 අයි | ඔසනගොඩ | 435 |
| 11 | 99 ජේ | කුඹල්වැල්ල උතුර | 236 |
| 12 | 97 | කොන්ගහ | 331 |
| 13 | 97 ඒ | වැලිවත්ත | 559 |
| 14 | 97 බි | මඩපාතල | 616 |
| 15 | 97 සී | පොකුණවත්ත | 210 |
| 16 | 97 ඩී | දංගෙදර නැගෙනහිර | 731 |
| 17 | 98 | මඩවලමුල්ල දකුණ | 349 |
| 18 | 98 ඒ | මඩවලමුල්ල උතුර | 1042 |
| 19 | 98 බී | බටගන්විල | 430 |

| | | | |
|---|---|---|---|
| 20 | 98 සී | සංඝමිත්තපුර | 296 |
| 21 | 98 ඩී | දංගෙදර බටහිර | 589 |
| 22 | 99 | මාගාල්ල | 479 |
| 23 | 99 ඒ | තලාපිටිය | 1825 |
| 24 | 99 බී | පෙට්ටිගලවත්ත | 499 |
| 25 | 99 සී | මකුළුව | 1436 |
| 26 | 99 ඩී | දේවාතුර | 364 |
| 27 | 100 | කටුගොඩ | 854 |
| 28 | 100 ඒ | දෙවට | 282 |
| 29 | 101 | මාඉටිපේ | 467 |
| 30 | 101 ඒ | දෙද්දුගොඩ දකුණ | 632 |
| 31 | 101 බී | මිලිද්දුව | 822 |
| 32 | 101 සී | දෙද්දුගොඩඋතුර | 616 |
| 33 | 101 ඩී | වැලිපත | 744 |
| 34 | 101 ඊ | මලිගස්පේ | 267 |
| 35 | 102 | දඩල්ල බටහිර | 517 |
| 36 | 102 ඒ | දඩල්ල නැගෙනහිර | 370 |
| 37 | 102 බී | වලව්වත්ත | 458 |
| 38 | 102 සී | සියඹලාගහවත්ත | 673 |
| 39 | 103 | ගිංතොට බටහිර | 366 |
| 40 | 103 ඒ | ගිංතොට නැගෙනහිර | 362 |
| 41 | 105 | වැලිපිටිමෝදර | 779 |
| 42 | 106 | කුරුඳුවත්ත | 919 |
| 43 | 107 | පියදිගම | 595 |
| 44 | 107 ඒ | බෝපේ උතුර | 282 |
| 45 | 108 | උක්වත්ත නැගෙනහිර | 221 |